ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2016 සැප්තැම්බර් 21 යොමු අංකය: 1617-004

දයාබර දෙමව්පියන් වෙත,

**දහම් පාසලට දරුවන් ලියාපදිංචි කිරීමට දිනපතා පාසලෙන් අවශ්‍ය ලිපිය / සහතිකය**

දහම් පාසලේ නව අධ්‍යයන වසරට සිසු සිසුවියන් ලියාපදිංචි කිරීමේදී අවශ්‍ය ලිපි සහ සහතික පිළිබඳ ඔබසැම මෙසේ දැනුවත් කරමු.

අයදුම් පත්‍රයේ සහ කොන්දේසි මාලාවේ සඳහන් පරිදි දහම්පාසලට දරුවකු ඇතුළු කිරීමට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ තිබිය යුතුයි:

1. 2016 අගෝස්තු මස 31 වැනිදාට වයස අවුරුදු හය (6) සම්පූර්ණ වී තිබීම, එනම් 2010 අගෝස්තු 31 දින හෝ එදිනට පෙර උපන් දරුවෙක් වීම

   හෝ

2. දිනපතා පාසලේ එක (01) ශ්‍රේණියේ ඉගෙනුම ලබන සහ 2016 අගෝස්තු මස 31 වැනිදාට වයස අවුරුදු 5 සම්පූර්ණ කල දරුවෙකු වීම

ඉහත අංක 2 අනුව දිනපතා පාසලේ අවම වශයෙන් 01 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන බවට සනාථකිරීමට එම පාසලෙන් ලබාගත් ලිපියක් හෝ සහතිකයක් ඉදිරිපත් කල යුතුය. මෙහි සඳහන් ‘සහතිකය’ පිලිබඳ වැඩිදුර පැහැදිලිකිරීමක් පහතින් දක්වමු.

සහතිකයක් යනු:

- ඩුබායි එමිරේටයේ පාසල් වල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා Knowledge and Human Development Authority (KHDA) විසින් නිකුත් කරන අත්සන් සම්පූර්ණ කරන ලද Parent - School Contract.
- සාර්ජා එමිරේටයේ පාසල් වල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා Sharjah Ministry of Education විසින් අත්සන් යොදා සහතික කරන ලද Final Report Card.
- අනෙකුත් එමිරේටයන් හි පාසල් වල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා පාසලෙන් ලබාගත් ලිපියක් හෝ ඉහත සහතිකයන්ට සමාන සහතිකයක්.

මෙම ලියවිලි වලට අමතර කිසිම ලියවිල්ලක් භාර නොගන්නා බවද කරුණාවෙන් දැනුම් දෙමු. මෙහිදී ඔබ සැමගේ සහයෝගය උදෙක්ම අපේක්ෂා කරමු.

ස්තුතියි,
සංවිධායක කමිටුව